සන්නස SANNASA


# ශ්‍රී ලංකාව මැයි දිනය සහ කම්කරු අයිතිවාසිකම්

**ආචාර්ය ලයනල් බෝපගේ**



**රාජ්‍ය අංශය බැංකු හා වෙළඳ අංශ සඳහා 1956 දී මැයි දිනය ශ්‍රී ලංකාවේ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. මැයි දින උත්සව වෙසක් උත්සවයේ උවමනාවන් හෝ ඒ වෙනුවෙන් පවත්වන උත්සව කටයුතු සමඟ කිසි විටෙකත් ගැටුම්කාරී වී නැත. මෙම තත්ත්වය ගැන නොසළකා සහ උපදේශනයකින් තොරව ජනාධිපතිවරයා විසින් මෙම වසරේ වෙසක් සතියක් පැවැත්වීමට නියමිතය යන්න කඩතුරාවක් ලෙස යොදා ගනිමින් මැයි දිනය කල් තබන්නට ඒකමතිකව තීරණය කොට ඇත. ඊයේ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් නිකුත් කරන ගැසට් නිවේදනයකින් මැයි 1 ට යෙදී ඇති මැයි දින නිවාඩුව අවලංගු කර තිබේ.**

ජනාධිපතිවරයා ශ්‍රී ලංකාවේ මැයි දින උත්සව මැයි 7 වන දා දක්වා කල් දැමීම මහනායක හිමිවරුන් විසින් කරන ලද ඉල්ලීමක් නිසා වූයේයයි කියනු ලැබේ. මෙය වැඩකරන ජනතාවගේ අවධානය දවසේ දැවෙන ප්‍රශ්නවලින් ඉවතට යොමු කිරීමෙන් ඔවුන්ගේ විරෝධතා වළක්වා ලීම සඳහා ආගමික හැඟීම් යොදා ගැනීමේ ගොරහැඩි දේශපාලන කූටෝපායකි. කම්කරුවන්ගේ අවශ්‍යතා නියෝජනය කිරීමට නියමිත පක්ෂ හා වෘත්තීය සමිති සමහරක් දැනටමත් ආන්ඩුව සමග පෙළ ගැසී ඇත. අනෙක් අය පෙළපාලි යාමට එරෙහිව නාගරිකව පනවා ඇති තහනම් කිරීම් නොතකා ඔවුන්ගේ විරෝධතා මැයි 1 වන දා වීදි බස්වන්නට තීරණය කොට ඇත.

වෙසක් දිනය මැයි දිනය සමග එක පිට වැටීමේ ගැටළුව මීට ඉහත බොහෝ වාරයක් මතුවී තිබේ. මෙය සිදු වන අවස්ථාවලදී ආගමිකත්වයේ මුහුණත දෘශ්‍යමාන වෙයි. 1967 දී එක්සත් ජාතික පක්ෂ පාලනය මැයි දින උත්සව මැයි 2 දක්වා කල් තැබීය. ප්‍රවෘත්ති වාර්තාවල උපුටා දක්වා ඇති අන්දමට කොමියුනිස්ට් පක්ෂය (බීජිං පිළ) එයට විරුද්ධ වූ අතර මෛත්‍රීපාල සිරිසේන කොමියුනිස්ට් පක්ෂයේ තීරණයට සහාය දුන්නේය. මැයි දින උත්සව කල් දැමීමෙන් දැන් ඔහුම තම අවස්ථාවාදය ප්‍රදර්ශනය කරමින් තිබේ. මැයි මස 1 ජාත්‍යන්තර කම්කරු දිනය සැමරීම කම්කරුවන්ගේ අයිතියක් බව අවධාරනය කරමින් ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති කිහිපයක් මැයි දිනය කල් දැමීමේ මෙම තීරණයට දැඩි ලෙස විරෝධය පල කර තිබේ. ජනතා විමුක්ති පෙරමුණ මැයි දින රැලිය පවත්වන බව ප්‍රකාශ කොට ඇතත් කොළඹ රැලිය මැයි 7 පවත්වනු ඇත. ඔවුහු ඔවුන්ගේ මැයි දින රැළිය මැයි 1 යාපනයේ පැවැත්වීම සැළකිය යුත්තකි. කම්කරුවන්ගේ අයිතිවාසිකම් පරයා ආගමට ප්‍රමුඛත්වය දීම පිළිබඳ ප්‍රශ්නයට අභිමුඛ නොවන්නට මෙම තේරීම කරන්නේදැයි යන්න කෙනෙකුට ප්‍රශ්න කළ හැකිය. ජනතා විමුක්ති පෙරමුණට අනුව මැයි 1 දිනයේ දී උත්සව සඳහා කොළඹට විශාල ජනකායක් ගෙන ඒම කොළඹ පැවැත්වීමට නියමිත වෙසක් උත්සවවලට බාධාවක් වනු ඇත. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණ දෙගිඩියාවට පත්වූ පළමු අවස්ථාව මෙය නොවේ. 2008 දීණි වෙසක් උත්සවය හේතුවෙන් මැයි 1 වන දායින් මැයි දිනය වෙනස් කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටිමින් ජනතා විමුක්ති පෙරමුණ ඊට පුරෝගාමී වූයේය.

මෙම වසරේ වෙසක් දිනය මැයි 1 දාට නොවැටේ. මෙම ගැටුම හට ගෙන ඇත්තේ මෙම වසරේ වෙසක් සතියක් ප්‍රකාශයට පත් කිරීම හේතුවෙනි. වෙසක් සතිය වාර්ෂික සිදුවීමක් බවට පත්කරනු ලැබුවහොත්, ජනතා විමුක්ති පෙරමුණේ ස්ථාවරය කුමක් වනු ඇත්දැයි යන්න දැන ගැනීම වැදගත් වෙනු ඇත. ජනතා විමුක්ති පෙරමුණේ ස්ථාවරය කෙනෙකුට එක ගලකින් කුරුල්ලන් දෙදෙනෙකු මරා දැමීම හා සමඟ පහසුවෙන් අර්ථ කථනය කළ හැකි ය. එසේ ගත් විට ඔවුහු ශ්‍රී ලංකාවේ දකුණේ වැඩ කරන ජනතාවට, කොළඹ පදිංචිව සිටින ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට ජාත්‍යන්තර කම්කරු දිනයේ අදාලත්වය නොසළකා මැයි 1 දා කොළඹ මැයි රැළිය පැවැත්වීම මඟ හරිති.

1977 නොවැම්බර් මාසයේ දී අප බන්ධනාගාරයෙන් නිදහස් කරන ලද විට කම්කරුවන් සූදානම් කිරීම සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ ස්ථාවරය වූයේ ඔවුන්ගේ පුද්ගලික දේශපාලන බැඳියාව සැළකිල්ලට ගැනීමෙන් තොරව තනි කම්කරු ෆෙඩරේෂනයක් (සම්මේලනයක) තුල ඔවුන් සංවිධානය කිරීමයි. සටන් පාඨය වූයේ එක් කර්මාන්තයක් සඳහා එක් වෘත්තීය සමිතියක් යන්නයි. කෙසේ වෙතත් මෙය සිදු නොවූ අතර ජනතා විමුක්ති පෙරමුණ සමාජවාදී කම්කරු සංගමයේ ධජය යටතේ තමන්ගේ ම වෘත්තීය සමිතියක් පිහිටුවා ගත්තේය. පක්ෂ මාවත් ඔස්සේ කම්කරුවන්ගේ එකමුතුව මෙසේ භින්න වී යාම ශ්‍රී ලංකාව හා ඉන්දියාව ඇතුළු බොහෝ රටවල දකින්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ කම්කරුවෝ එක්සත් ජාතික පක්ෂයණී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වැනි ධනේශ්වර දේශපාලන පක්ෂ සමග සම්බන්ධ වී සිටිති. වම සමඟ සම්බන්ධව සිටින අය පවා බොහෝ දේශපාලන පක්ෂ හා කණ්ඩායම් වටා විසිරී ඇත. මෙම දේශපාලන ආයතන සෘජු ලෙස හෝ ධනේශ්වර පාලක සභාගයේ කොටස්කරුවන් ලෙස හෝ, රටේ කම්කරුවන් හා තරුණයන් විසින් මෙහෙයවන ලද බොහෝ අරගල ප්‍රචන්ඩකාරී ලෙස මර්දනය කොට තිබේ. වෘත්තීය සමිති අතර ඇති නිකායවාදය ඒකාබද්ධ මැයි දින උත්සව නොපවත්වන්නට සම්මාදම් වීමෙන් කම්කරු ව්‍යාපාරයේ දුර්වලතාවයටද දායක වේ. වෘත්තීය සමිතිවල වලංගුභාවයට මහජනතාව ඉදිරියේ හානි පමුණුවන සාධකයන්ගෙන් එකක් වන මෙය වැඩ කරන ජනතාවගේ ඇතැම් කොටස්වල උදාසීනත්වයටද හේතු කාරක වී තිබේ. තමන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා ස්වාධීනව බලමුලු ගැන්වෙනු වෙනුවට කම්කරුවෝ දැන් තම අභිප්‍රාය වෙත කට වචනයෙන් පමණක් ප්‍රතිචාර දක්වති. මේ අතර පාලන තන්ත්‍රය පැය අටේ වැඩ දිනය ඇතුළුව දුෂ්කර ලෙස අත් කර ගන්නා ලද කම්කරු අයිතිවාසිකම් පැහැර ගන්නට කටයුතු කරම් න්ණි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ලෝක බැංකුවේ උපදෙස් සහ න්‍යාය පත්‍රය අනුව කටයුතු කරමින් සිටී. එක් කර්මාන්තයක් සඳහා එක් වෘත්තීය සමිතියක් යන ප්‍රතිපත්තිය මත පදනම් වෙමින් වෘත්තීය සමිති සංවිධානය වන තෙක් මෙම තත්වය වෙනස් නොවෙනු ඇත. ඒ සමඟම එවැනි එකමුතුවක් සඳහා එකම සහතිකය වනු ඇත්තේ වෘත්තීය සමිති තුල ප්‍රජාතන්ත්‍ර වාදය ක්‍රියාත්මක කිරීමයි.

දකින්නට ඇති අන්දමට, සහභාගිත්වයෙන් තීරණ ගැනීම සඳහා විවිධ දේශපාලන අදහස් සහිත වැඩ කරන ජනයාට එකට එක්වන්නට ඉඩ කඩ සපයන ප්‍රධාන වෘත්තීය සමිතිවලින් එකක් වන්නේ නැසීගිය බාලා තම්පෝ සහෝදරයා විසින් කලින් නායකත්වය දෙන ලද ලංකා වෙලඳ සේවක සංගමයයි.කෙසේ වෙතත්ණී විවිධ දේශපාලන මත සහිත කම්කරුවන්ට සංගමයට බැඳෙන්නට අවසර ලබා දී තිබුනදණී ඔහුගේ දිගු කාලීනවූ නිලකාල සීමාව තුළදී ණීඔහුගේ අභාවය සිදු වෙන තෙක් ප්‍රධාන ලේකම්වරයා විසින් සංගමය මත දැඩි ග්‍රහණයක් පවත්වා ගෙන ගිය බව මම සටහන් කරමි.

මේ අනුවණී මැයි දිනය වැඩ දිනයක් බවට ප්‍රකාශයට පත් කර තිබේ. එපමණක් නොව, එක්සත් ජාතික පක්ෂය විසින් පාලනය කරන කොළඹ මහ නගර සභාව කොළඹ මහජන උද්‍යානවල මැයි 1 වැනිදා මැයි දින රැළි පැවැත්වීම සඳහා අවසර දීම ද ප්‍රතික්ෂේප කොට ඇත. මෙය පැහැදිලිවම කොළඹ සියළුම මැයි දින උත්සව තහනම් කිරීමකි. මැයි 1 වන දා මැයි දින උත්සව සංවිධානය කරන්නන්ට එරෙහිව මෙම ආණ්ඩුව ගන්නා මර්දනකාරී ක්‍රියාමාර්ගවල ස්වරූපය, පසුගිය පාලනය එවකට පැවති කම්කරු අරගලවලට එරෙහිව ගන්නා ලද ප්‍රචණ්ඩ මර්දනකාරී ක්‍රියාමාර්ගය සමඟ බොහෝ විට සැසඳිය හැකිය. එක්සත් ජනපදය හා තවත් රටවල් කීපයක් කර ඇති ආකාරයටණී ශ්‍රී ලංකා ආණ්ඩුව වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් විවෘතවම දමනය කරන්නට ඉදිරිපත් වී තිබෙන බව පෙනේ.

දහ නවවන සියවස අග භාගයේදී සමාජවාදී කන්ඩායම් බොහොමයක් බිහි වුන

10 වන පිටට

Advice on Legal Matters

GATEWAY LAWYERS

Senanie Kurukularatne LL.B
Barrister & Solicitor
Director-Principal
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

Business & Commercial Law
Sale & Purchase of Busines | Leases | Franchises
Conveyancing
Residential, Commercial & Rural
Sale & Purchase | Vendor Statements
Auction Contracts | Contract of Sales
Subdivisions
Probate & Testamentary
Wills | Power of Attorney
(Foreign, Special, Enduring & Medical)
Deceased Estates & Administration
Family Law
Divorce | Consent Orders
Property Settlements | Binding Financial Agreements
Migration Law
General Skilled | ENS/RMS
Spouse | Contributory Parents
Visitor......etc



GATEWAY LAWYERS (AUSTRALIA) PTY LTD
Suite 20, 26-28 Verdun Drive
Narre Warren VIC 3805 Australia
PO Box 730 Berwick VIC 3806 Australia
DX 30463 Berwick VIC 3806 Australia
Tel +61 3 9704 9756
Fax +61 3 9704 5902
Mobile +61 414 660 513
info@gatewaylawyers.com.au
www.gatewaylawyers.com.au